# 2

# සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අවතැන්වූවන් ප්‍රතිස්ථාපනය කිරීම අවතැන්වූවන්ගේ ජීවිත නගාසිටුවීමට කරන ලද දායකත්වයඃ
## (යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය ඇසුරින්)

**සංජීවනි මහේෂිකා මල්වත්ත, ශාස්ත්‍රපති උපාධි අපේක්ෂිකා**
**මහාචාර්ය වසන්තා සුබසිංහ**

***සාරාංශය***

මෙම අධ්‍යයනයේ පර්යේෂණ ගැටලුව වූයේ සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අවතැන්වූවන් ප්‍රතිස්ථාපනය කිරීමෙන් ප්‍රතිස්ථාපිතයින්ගේ ජීවිත ගොඩනැගුණේ ද? යන්න සෙවීමය. පර්යේෂණ පරමාර්ථය වූයේ අවතැන්වූවන් ප්‍රතිස්ථාපනය කිරිමේදී විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනිමයි. පර්යේෂණ අරමුණු වූයේ ප්‍රතිස්ථාපිතයින් ප්‍රතිස්ථාපනයෙන් පසු මුහුණපාන සමාජීය තත්ත්වය හඳුනාගැනිම සහ ප්‍රතිස්ථාපනයේ දී අවධානය යොමු කළයුතු විශේෂ කරුණු හඳුනාගැනිමය. මෙම ප්‍රමාණාත්මක හරස්කඩ පර්යේෂණය ප්‍රත්‍යක්ෂමූලික ක්‍රමවේදය මුල්කර ගනිමින් සිදුකරන ලදී. පර්යේෂණ විධික්‍රමය සමීක්ෂණ ක්‍රමය වූ අතර දත්ත රැස්කිරිම ව්‍යුහගත ප්‍රශ්නාවලි සහ අර්ධ ව්‍යුහගත සම්මුඛසාකච්ඡා මගින් සිදු කරන ලදී. යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතියේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ඌරුෑව ගම්මානය සහ වාහල්කඩ ඩී 6 ගම්මානයෙන් පවුල් 51 ක් ලබාගන්නා ලදී.

යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය පිළිබඳ සිදුකළ මෙම අධ්‍යයනයේදී ආර්ථික, සමාජ. පාරිසරික ගැටලු මෙන්ම ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය පිළිබඳ අවතැන්වූ ප්‍රජාවගේ ආකල්ප, ඉඩම් සහ වන්දිවල ස්වභාවය, අධ්‍යාපනික ගැටලු, යටිතල පහසුකම් පිළිබඳ ගැටලු පිළිබඳ අවධානය යොමු විය. යාන් ඔය ව්‍යාපෘතිය හරහා මොවුන්ගේ මුල් පදිංචි කුඹුරු ඉඩම් ජලාශයට යට වු අතර දැනට ඔවුන්ගේ සමාජ-ආර්ථිකය තත්ත්වය අඩපණ වී ඇත. ඔවුන්ට හේන් ගොවිතැන සදහා මුල් පදිංචියේදි ඉඩම් තිබු අතර මෙම ව්‍යාපෘතිය හරහා හේන් සඳහා වු ඉඩමක් නොලැබුණු අතර ඔවුන්ගේ ද්විතික ආදායම් මාර්ග අහිමි වී ඇත. එමෙන්ම ප්‍රජා මුල සංවිධානය බිඳ වැටීම හේතුවෙන් ජනතාවගේ සමාජ ඒකාබද්ධතාවට තිබූ ඉඩකඩ ඇහිරී ඇත. ඉඩම් ලබාදීමේ තිබු සමානාත්මතාව සහ කුඹුරු ඉඩම් ලබා දීමේදි තිබු සමානාත්මතාව හේතුකොටගෙන මුල් පදිංචියේදී තනි අයිතිය සහිත ඉඩම් වැඩි ප්‍රමාණයක් තිබු පිරිස් අසාධාරණයට ලක්වීම සහ ප්‍රධාන පවුල් සහ අනුපවුල් යටතේ ඉඩම් ලබාදිම හේතුවෙන් විස්තෘත පවුල් යටතේ සිටි බොහෝ දෙනාට සාධාරණයක් ඉටුවිමත් මෙහිදි හදුනාගත හැකිය.

**මුඛ්‍යපදඃ** සංවර්ධන ව්‍යාපෘතිය, අවතැන්වූවන්, නැවත පදිංචිය, ජීවිතයේ ගුණාත්මක බව

## 1. හැඳින්වීම

සැලසුම්කරණයේදී වැදගත්ම සාධකය වන්නේ සම්පත්ය. එනම් යෙදවුම් හෝ අමුද්‍රව්‍යය. රටක් සම්පත්වලින් බහුල නම් සැලසුම්කරණය හරහා සංවර්ධනය කරා ගමන් කිරීම වඩාත් පහසු සහ වේගවත් වේ. සංවර්ධන සැලසුම්කරණයේදී ප්‍රධාන සම්පත් වර්ග තුනක් හඳුනාගත හැකිය. එනම් මානව සම්පත, ස්වභාවික සම්පත සහ මූලධන සම්පතයි. රටක් සංවර්ධන සැළසුමක් නිර්මාණය කිරීමේ අවසාන ඵලය වන්නේ එම සංවර්ධන උපායමාර්ගය එම රටේ ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරලීම සඳහා බලපෑම් කිරීමය. එම 'සංවර්ධනය' තුළ ප්‍රධාන ලක්‍ෂණ කීපයක් අන්තර්ගත විය යුතු බව සංවර්ධන අධ්‍යයන මහාචාර්ය හිරණ්‍ය ඩී. ඩයස් සහ බී.ඩබ්.ඊ. වික්‍රමනායක විසින් රචිත 'ගැමි සංවර්ධන සැළසුම්කරණය' කෘතිය පෙන්වා දේ.

01. එය සියල්ලටම නොහැකි නම් අඩු තරමින් ඉතාම වැඩි පිරිසකටවත් දියුණුවක් ගෙන එන වෙනසක් විය යුතුය.
02. එයින් අවාසියක් සිදුවෙනවා නම් එසේ විය යුත්තේ එයින් වාසි ලබන පිරිසකට වඩා ඉතාම අඩු පිරිසකටය.
03. එය අඩු තරමින් ජනයාගේ අවම නැතහොත් අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරාලන්නක් විය යුතුය.
05. එය ස්වශක්තිය දිරිගන්වන්නක් විය යුතුය.
06. එය කල්පවත්නා දියුණුවක් ඇති කරලන්නක් විය යුතුය.
07. එය ස්වභාවික පරිසරය විනාශ කරලන්නක් නොවිය යුතුය (ඩයස් සහ වික්‍රමනායක, 1983, පි. 4).

සංවර්ධන සැළසුමක් නිරන්තරයෙන්ම නම්‍යශීලීවිය යුතුය. ඉලක්කගත සමාජ කණ්ඩායමේ අවශ්‍යතා මත සැළසුම් වෙනස්කිරීමේ හැකියාව තිබිය යුතුය. වෙනස් කළ නොහැකි එසේත් නැතිනම් ගතික බවින් යුක්ත නොවන සැලසුම් සංවර්ධනය වෙනුවට විසංවිධානය ගොඩනගයි. හවුල්කරුවන් යනු සංවර්ධන සැලසුම් හා සම්බන්ධ වන පුද්ගල කණ්ඩායම්, ආයතන සහ ප්‍රතිපත්තීන්ය. මේවායේ පවත්නා අන්තර් සබඳතා සහ අවබෝධතා පොදු ප්‍රජාවගේ දැක්ම වෙත ළඟා වීමට යන ගමනේදී වැදගත් වේ. මුල් කාලීනව ආර්ථික වර්ධනය පමණක් සංවර්ධනය ලෙස හඳුනාගත් අතර 21 වන සියවස ආරම්භයත් සමග සංවර්ධනය යන්න ආර්ථිකය පමණක් නොව එය සමාජ, සංස්කෘතික, ආගමික, දේශපාලන ආදි විවිධ දෘෂ්ටීන් මත පදනම් වී ගමන් ගන්නා වූ සංකල්පයක් බව හඳුනා ගැනුණි. ඒ සමග සංවර්ධනය රටේ ජනතාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම අරමුණු කරගත් සංකල්පයක් බවට පත්විය.

සංවර්ධන ආර්ථික විද්‍යාඥ ඩඩ්ලි සියර්ස් (1920-1983) ඉදිරිපත් කළ විශ්ලේෂණය මෙහිදී වැදගත්ය. ආර්ථික විද්‍යාඥයෝ සංවර්ධනය, ආර්ථික වර්ධනය සමග එක් කරමින් ඒකපුද්ගල ආදායම පිළිබඳ විග්‍රහ කළහ. නමුත් සියර්ස් 'සංවර්ධනය' අර්ථ ගැන්වූයේ ඊට වඩා පුළුල් අර්ථයකිනි. ඔහු දක්වන පරිදි සංවර්ධනය දියුණුව සමඟම සාකච්ඡා වන අගනාකම් විනිශ්චය වන ප්‍රතිමානික සංකල්පයකි. දුගීකම මූලික අවශ්‍යතා ඉටු කරගැනීමට නොහැකිවීමට පමණක් සීමා නොවන අතර රැකියාවක් නොමැති වීමෙන් පුද්ගලයාට ඇතිවන යැපීම් මානසිකත්වයත් පුද්ගලයාගේ ආත්ම අභිමානය හීනවීමත් දරිද්‍රතාවයම වේ. එනිසා සියර්ස් රටක සංවර්ධනය මෙසේ අර්ථ ගැන්වීය. "රටක දිළිඳුකමට සිදුවෙමින් පැවත ඇත්තේ කුමක්ද? සේවා වියුක්තියට සිදුවෙමින් පැවත ඇත්තේ කුමක්ද?

අසමානතාවට සිදුවෙමින් පැවත ඇත්තේ කුමක්ද? මේ කරුණු තුනම ඉහළ මට්ටමක සිට පහළ බැස ඇත්නම් එය නිසැකවම අදාළ රටට සංවර්ධන කාල පරිච්ඡේදයක් වී ඇත" (Seers, 1969) යනුවෙන් සඳහන් කරයි.

සංවර්ධන ව්‍යාපෘතිවලදී පූර්ව හඳුනාගැනිම් කටයුතු කිරීමේදී ව්‍යාපෘතිය සිදුකරන වපසරිය තුළ ඇති සංවර්ධන න්‍යාය සහ සංකල්ප මෙන්ම ස්වභාවික සම්පත් පිළිබඳ දත්ත හඳුනාගැනිමත් මානව සහ සමාජ-ආර්ථික දත්ත හඳුනාගැනිමත් සිදුවේ (Vitharana, 2014). පස, ජලය, වර්ෂාපතනය, භූගත ජලය ආදි ස්වභාවික දත්ත සහ ජනගහනය, දේපල ඉඩකඩම්, ස්ත්‍රීපුරුෂභාවය, මහාමාර්ග ආදායම්, ජීවන තත්ත්වයන්, රාජ්‍ය පෞද්ගලික පරිපාලන ආයතන ආදි දත්ත හඳුනාගැනිමක් කළ යුතුවේ. ව්‍යාපෘතියට අදාළ අරමුණු ජාතික අරමුණු සමඟ ගැලපේද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කළ හැකිද යන්න සහ ව්‍යාපෘතියෙන් අපේක්ෂිත ප්‍රතිලාභ ජනතාවට ලැබේද යන්න සොයා බලනු ලැබේ. සංවර්ධන ව්‍යාපෘතිය ප්‍රතිලාභ ලැබීම අවස්ථා දෙකක් මත සිදුවේ. එනම් ව්‍යාපෘතියෙන් අවතැන්වන ප්‍රජාවට ලැබෙන ප්‍රතිලාභ සහ ව්‍යාපෘතිය සිදුකිරිමෙන් පසු එහි ප්‍රතිඵලයක් ලෙස ලැබෙන ප්‍රතිලාභ ලබන්නන් වශයෙනි. ව්‍යාපෘතිය නිසා ඉන් අවතැන්වූවන්ට ලැබෙන ප්‍රතිලාභ ධනාත්මක නම් කිසිඳු වරදක් හෝ බලපෑමක් ඇති නොවේ. නමුත් එහි ප්‍රතිලාභ සෘණාත්මක නම් එහි ප්‍රතිපල අවදානම් සහගත වනු ඇත.

ශ්‍රී ලංකාවේ සංවර්ධන ව්‍යාපෘති අතර ජල සම්පත් මුල්කරගත් ව්‍යාපෘති ඉතා වැදගත් වන අතර එහිදී ලුණුගම්වෙහෙර, ගල්ඔය ව්‍යාපාරය, උඩවලවේ ව්‍යාපෘතිය, මහවැලි සංවර්ධන ව්‍යාපෘතියත් ඒ යටතේ පොල්ගොල්ල, බෝවතැන්න ජලාශත්, වික්ටෝරියා ජලාශත්, කොත්මලේ, රන්දෙණිගල, උමා ඔය, ලොග්ගල් ඔය ආදි ජලාශ ව්‍යාපෘති විය. එසේම මෑතකාලින වශයෙන් සංවර්ධන ව්‍යාපෘති යටතේ ක්‍රියාත්මක වන යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතියත් ජල සම්පත් ව්‍යාපෘති අතර ප්‍රධාන වේ. එසේම අධිවේගි මාර්ග සංවර්ධන ව්‍යාපෘති, නගර සංවර්ධන" සංචාරක කර්මාන්ත සංවර්ධනය" ග්‍රාමීය සංවර්ධන යෝජනා ක්‍රම" වාලච්චේන" ඇඹිලිපිටිය කඩදාසි කම්හල්" උඩවලවේ මත්ස්‍ය කර්මාන්ත, හම්බන්තොට වරාය ආදි මේ සියල්ල සංවර්ධන ව්‍යාපෘති යටතේ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වු මහ පරිමාණ ව්‍යාපෘති කිහිපයක් වේ. මෙහිදී හඳුනා හැකි මූලිකම පාර්ශවය වන්නේ අවතැන්වූවන්ය. බොහෝ දුරට සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් සිදුවන ප්‍රතිස්ථාපන සිදුවන්නේ ස්වේච්ඡාමය නොවන ක්‍රියාවලියක් ලෙසය. ස්වේච්ඡාවෙන් නැවත පදිංචි කිරිම යනු එකිනෙකට වෙනස් නමුත් ඊට සම්බන්ධ ක්‍රියාවලින් දෙකකි. ස්වේච්ඡානුගත නැවත පදිංචිය ජනතාවගේ ස්වකැමැත්ත මත සිදුවේ. ස්වෙච්ඡානුගත නොවන නැවත පදිංචිය තුළ රජයේ හෝ වෙනත් ආයතනයක හෝ සංවර්ධන ක්‍රියාවලියක ප්‍රතිඵලයක් වශයෙන් ජනතාවගේ කැමැත්ත නොසලකා සිදු කරයි.

## 2. පර්යේෂණ ගැටලුව විග්‍රහ කිරිම.

**සංවර්ධන ව්‍යාපෘති හේතුවෙන් අවතැන්වූවන් ප්‍රතිස්ථාපනය කිරීමෙන් ප්‍රතිස්ථාපිතයින්ගේ ජීවිත ගොඩනැගුණේද?** මෙය හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතව සිදුකරන ලදී. විශේෂයෙන් මෙවැනි තත්ත්ව තුළ සාමාන්‍ය ජන ජිවන රටාවෙන් බැහැරවු ජනතාවගේ ජිවන රටාව, සංස්කෘතියක යහපැවැත්ම, ධර්මතා හා විශ්වාස, සමාජ සබඳතා ජාල වෙනස්වීම සිදුවිය හැක. එසේම මෙවැනි අවස්ථාවලදී කාන්තාවන්, ළමුන්, වයෝවෘද පිරිස් ආදි කාණ්ඩ සෘජු ලෙසම පීඩාවට පත්විය හැකිය. විශේෂයෙන් කුල කණ්ඩායම්, සංස්කෘතින්, විවිධ ජාතීන් මෙන්ම

විවිධ සමාජ සම්බන්ධතා ආශ්‍රිතව ගැටලු ඇතිවිය හැක. එසේම නැවත පදිංචි කිරිමකදී අවතැන් වු පිරිස් වෙත විශේෂයෙන් ඇතිවන ආර්ථිකමය බලපෑම වැදගත්ය. ජිවනෝපාය මාර්ග වෙනස්වීම, තමන් පවත්වාගෙන ආ ජිවනෝපාය මාර්ග අහිමිවීම, පාරම්පරික රැකියා මාර්ග බිඳ වැටීම, කෘෂිකර්මාන්තය බිඳවැටිම, වගා ක්‍රම අහිමි වීම ආදි වෙනස්කම් රැසක් ඇති විය හැකිය. එසේම සංවර්ධනය වෙමින් පවතින රටක් ලෙස ශ්‍රි ලංකාව සංවර්ධන ව්‍යාපෘති සිදුකිරිමේදි ප්‍රතිස්ථාපනය සඳහා හසුවන ජන කණ්ඩායම් කවුරුන්ද සහ එම ජන කණ්ඩායම්වල ප්‍රතිස්ථාපනය පිළිබඳ දක්වන අදහස් ආකල්ප කෙබදුද යන්න හඳුනාගැනිම වැදගත් වනු ඇත.

## 3. පර්යේෂණයේ පරමාර්ථය හා අරමුණු

### පරමාර්ථය

අවතැන්වුවන් ප්‍රතිස්ථාපනය කිරිමේදී විධිමත් ක්‍රියාවලියක් අනුගමනය කිරීමේ අවශ්‍යතාව හඳුනාගැනිම.

### අරමුණු

1 ප්‍රතිස්ථාපිතයින් ප්‍රතිස්ථාපනයෙන් පසු මුහුණපාන සමාජීය තත්ත්වය හඳුනාගැනිම.
2 ප්‍රතිස්ථාපනයේදී අවධානය යොමු කළයුතු විශේෂ කරුණු හඳුනාගැනිම.

## 4. පර්යේෂණයේ න්‍යායාත්මක පසුබිම හා අධ්‍යයන ක්‍රමවේදය

ඇමෙරිකානු මනෝ විද්‍යාඥ ඩේවිඩ් මැක්ලෙලන්ඩ් ( 1917-1998) සංවර්ධනය සඳහා වූ 'සාධන අභිප්‍රේරණය' න්‍යාය පිළිබඳ *'The Achieving Society'* සහ *'Motivating Economic Achievement'* කෘති තුළින් විග්‍රහ කළේය. එහිදී ප්‍රධාන අවශ්‍යතා 3ක් දැක්වීය. එනම් සාධනය, බලය සහ අනුබද්ධ කිරීමයි (Braden, 2000). තනි පුද්ගලයෙකුට තමන්ගේ ජීවිතයේ සාධනීය අත්දැකීම් මඟින් පුද්ගල සංවර්ධනය ඇති කරගැනීමටත් එය සාර්ව මට්ටමේදී සමාජ සංවර්ධනය දක්වා ගමන් කිරීමටත් පාදක වන පුද්ගල පෞරුෂ සාධක ගැන සාකච්ඡා කළේය. සාධක අභිප්‍රේරණය සහිත පෞරුෂයක් ඇති පුද්ගලයා කාර්යක්ෂමය. අවදානම් දැරීමට ඉදිරිපත් වන්නෙකි. ඔහු කාල කළමණාකරණ හැකියාවෙන් යුක්ත දක්ෂ සැලසුම්කරුවෙකි. ජීවිතයේ ඉලක්ක හඳුනා ගනිමින් ඒවා ඉටුකිරීමට සිය උපරිම කැප කිරීම යොදන මෙම පුද්ගලයින් සංවර්ධනයට අත්‍යවශ්‍යය. එබැවින් ඔහු මෙය අවශ්‍යතා න්‍යාය (*The Theory of Needs*) ලෙස නම් කර තිබේ. ප්‍රතිපෝෂණය මෙම ක්‍රියාවලියේදී භාවිත කරන ප්‍රධාන සාධකයකි. පර්යේෂණයේදී මෙම න්‍යාය අත්හදා බලන ලදී.

ප්‍රමාණාත්මක හරස්කඩ පර්යේෂණයක් වූ මෙහි ප්‍රත්‍යක්ෂමූලවාදී ප්‍රවේශය භාවිත කරමින් සමීක්ෂණ සැලැස්ම ඔස්සේ ප්‍රශ්නාවලි සහ අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා මගින් මෙන්ම සහභාගි නොවන නිරීක්ෂණ තුළින් ද දත්ත රැස්කිරීම සිදුකළ අතර 51 ක් වූ දත්තදායකයන් ප්‍රමාණයක් මේ සඳහා සහභාගී විය. මෙම පර්යේෂණයේදි අධ්‍යයන ක්ෂේත්‍රය ලෙස යොදාගත්තේ බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස දැනට ශ්‍රි ලංකාවේ

සිදු කෙරෙන යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය ආශ්‍රිතවය. හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඩී1 වාහල්කඩ, පහල දිවුල්වැව, මරදන්මඩුව, වාගොල්ලාකඩ යන ග්‍රාම නිලධාරි වසම් 4 සහ ගෝමරන්කඩවල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ පඹුරුගස්වැව, ගල්කඩවල, කන්දමලාව යන ග්‍රාම නිලධාරි වසම් 3 ක ඉඩම් අත්පත් කරගනිමින් යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. එහිදි මෙම පර්යේෂණයේ අධ්‍යයන සීමාව වන්නේ හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ නැවත පදිංචි කර ඇති ඌරුව ගම්මානය සහ ඩී 06 වාහල්කඩ යන ගම්මාන දෙකයි. මෙහිදි ජලාශ භූමිය තුළ නිවාස සහිත මූලික පවුල් 81 ක් ඉවත් කරන අතර එම නිවාස තුළ අනුපවුල් 22 ක් සිටිති. මෙම පවුල් අතර ඌරුව ගම්මානයේ 46 ක් පදිංචිය සඳහා යොමුකර ඇති අතර පදිංචි කිරිමට අපේක්ෂිත සංඛ්‍යාව 574 කි. වාහල්කඩ ඩී 06 ගම්මානයේ 45 ක් පදිංචිය සඳහා යොදවා ඇති අතර පදිංචි කිරිමට අපේක්ෂිත සංඛ්‍යාව 635 කී. තවමත් මෙම ගම්මානවල ප්‍රතිස්ථාපන කටයුතු සිදුවෙමින් පවතින අතර අවතැන්වූවන් නිසි ප්‍රතිස්ථාපනයකට ලක් කර නොමැත. මෙම අධ්‍යයනය සඳහා හොරොව්පතාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයේ ඌරුව ගම්මානය සහා වාහල්කඩ ඩී 06 ගම්මාන තෝරා ගන්නා ලදි.

## 5. පූර්ව පර්යේෂණ විමසුම

ජයසිරි සහ පිරිස (2018): *A Gendered Analysis on Adaptation to Resettlement Stress: Case-Studies from Deduru Oya Reservoir Project in Sri Lanka* පර්යේෂණය දැදුරු ඔය ජලාශ ව්‍යාපෘතිය ඇසුරින් නැවත පදිංචි කිරිම් සිදුකිරිමේදි ස්ත්‍රී පුරුෂභාවය පදනම් කරගෙන ඇති වූ ගැටලු පිළිබඳ අනාවරණය කරයි. දැදුරු ඔය ආශ්‍රිතව අවතැන් වූ ජනතාව නැවත පදිංචිකිරිමේදි ඉඩම් අයිතිය සම්පූර්ණයෙන්ම පිරිමි පාර්ශවයට පවරා ඇත. එහිදි ස්ත්‍රී-පුරුෂ භූමිකාව පදනම් කරගැනිම, මිනිසුන් මානසික ආතතියට ලක්වීම මෙන්ම පුරුෂයාට වඩා කාන්තාව නැවත පදිංචි කිරිමත් සමග ඉතා ඉක්මණින් මෙම අලුත් පරිසරයට අනුවර්තනය වූ බව අනාවරණය කරයි. සාමාන්‍ය ජිවන රටාව බිඳවැටිම පිරිමි පාර්ශවයට ස්ථිර රැකියා සොයාගැනිමට පෙර කාන්තාව නිවස, තම පවුල ආරක්ෂා කරගැනිම සඳහා ගෙවතු වගාවලට යොමු වී ඇත. නමුත් මෙම නැවත පදිංචිකිරිමේ ක්‍රමවේදය තුළ කාන්තා පාර්ශවය දැඩි අසාධාරණයකට ලක් වී ඇති බවත් එහිදි පිතෘමූලික ඉඩම් ලබා දිමේ ක්‍රමවේදය නිසා පවුල තුළම ඇය කොන්කර ඇතිබව නිගමන තුළින් තහවුරු කොටගෙන ඇත.

කුමාරසිංහ. බී. (1998). මහකනදරාව ව්‍යාපාරයේ තුන්වන ගොවි පරපුර වෙත උදාවී ඇති සමාජ ආර්ථික ගැටලු පිළිබඳ පර්යේෂණයක් සිදු කර ඇත. ප්‍රමාණවත් වගාබිම් සඳහා සිටින ශ්‍රමිකයන්ගෙන් හෝ ආර්ථිකය සකස් කරගැනිමට අවශ්‍ය ජල පහසුකම් ප්‍රමාණවත් නොවීමත් යටිතල හා මූලික පහසුකම් පිළිබද ගැටලු, ආදයම් විෂමතා ආදි ගැටලු රැසක් පිළිබඳ අවධානය යොමු කොට ඇත. එහි තුන්වන පරපුර ජනතාවගේ අධ්‍යාපන මට්ටම ඉහළයාම නිසා ඔවුන් නගරයට සංක්‍රමණය වීමත් සමග කෘෂිකර්මාන්තය බිඳ වැටිමත්, පෞද්ගලික අංශයේ රැකියාවලට යොමු වීමත් දක්නට ලැබුණි. එම නිසා ගොවි ජනපදයේ කෘෂිකර්මාන්තය සඳහා ශ්‍රමබලකාය අඩු තත්වයක පැවතුණු බව මෙම අධ්‍යයනයේදි අනාවරණය කරයි.

## 6. සොයාගැනීම් සහ සාකච්ජාව

යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතිය අනුරාධපුර සහ ත්‍රිකුණාමල දිස්ත්‍රික්ක දෙක යටතේ ආවරණය වන අතර මෙම පර්යේෂණය අනුරාධපුර දිස්ත්‍රික්කයට පමණක් අවධානය යොමු කරමින් සිදුකරනු ලබයි. මෙහිදී යාන් ඔය ව්‍යාපෘතිය හේතුවෙන් ජලාශයට යට වූ පවුල් 51 ක් ස්ථිර ලෙසම පදිංචියට පැමිණ තිබේ. එම පවුල් ගණන 50% කි. එමෙන්ම ව්‍යාපෘතියෙන් තමන්ට හිමි වූ ඉඩමේ තනි කාමරයක් හෝ කුඩාවට නිවාසයක් සාදා පදිංචි නොවී වෙනත් ප්‍රදේශවල ජීවත් වන පිරිස් වේ. එම පවුල් ගණන 16% කි. යාන් ඔය ව්‍යාපෘතියෙන් නැවත පදිංචිය සඳහා ලබා දුන් ඉඩම් සඳහා පැමිණීම ප්‍රතික්ෂේප කළ පිරිස 34% කි. මෙසේ නැවත පදිංචිය ප්‍රතික්ෂේප නොකර ස්ථිර ලෙසම නිවාස තනවා නැවත පදිංචි වූ පිරිස් ස්ථාන දෙකක නැවත පදිංචිය සිදුවිය. මෙසේ නැවත පදිංචිය සඳහා යාන් ඔය සංවර්ධන ව්‍යාපෘතියෙන් ප්‍රදේශ දෙකක් තෝරා ගත් අතර එක් ස්ථානයක් ඌරුව ගම්මානයත් අනෙක් ස්ථානය වාහල්කඩ ඩී 6 වේ. මුල් පදිංචියේදි කපුගොල්ලෑව ප්‍රදේශයේ පුහුදිවුල ගම්මානයත්, කැබිතිගොල්ලෑව ප්‍රදේශයේ මාවතවැව සහ ඇලපත්වැව යන ගම්මානයන් මෙම ප්‍රදේශ දෙකෙහි නැවත පදිංචිය සඳහා යොමු කෙරිණි. මේ අනුව පුහුදිවුල මුල් ගම්මානය වෙන් වී කොටසක් ඌරුව ගම්මානයටත් කොටසක් වාහල්කඩ ඩී6 ගම්මානයටත් බෙදිණි. මාවතවැව සහ ඇලපත්වැව ගම්මානවල ජීවත් වූ පිරිස් තෝරා ගෙන ඇත්තේ නැවත පදිංචිය සඳහා වාහල්කඩ ඩී 6 ගම්මානයයි.

මෙහිදි හඳුනාගත හැක්කේ ප්‍රතිස්ථාපනය කරන ලද පවුල් සියල්ලෙහි සාමාජිකයන් සංඛ්‍යාව ගත් කළ ඉන් බහුතර පිරිසක් කාන්තාවන් වන බවයි. නමුත් ගෘහමූලිකත්වය ගත් කළ පුරුෂ පාර්ශවය බහුතරයක් දක්නට ලැබේ. නමුත් ස්ත්‍රී ගෘහමූලික පවුල් ද සැලකිය යුතු ප්‍රමාණයක් දක්නට ලැබේ. එහිදි ස්ත්‍රී ගෘහමූලික පවුල් සියල්ල ගත් කල ඉන් පවුල් 78% ස්වාමි පුරුෂයා මිය ගිය පවුල් ද, අනෙක් පවුල් 22% ක සැමියාගෙන් වෙන්ව දික්කසාද වූ පවුල් ලෙස හඳුනාගත හැකි විය. වයස අවුරුදු 5 ට අඩු ජනගහණය 11%ක් ද 5-18 ත් අතර 19% ක් ද 19-30 ත් අතර වයස් මට්ටමේ පුද්ගල සංඛ්‍යාව 18% ක් ද වේ. එමෙන්ම වයස් මට්ටම 31-40 ත් අතර ජනගහන 17% ක් ද, 41-50 ත් අතර ජනගහන 7% ක් ද (ක්ෂේත්‍ර දත්ත, 2020) වේ. එමෙන්ම වයස අවුරුදු 50 ට වැඩි පුද්ගල සංඛ්‍යාව 29% ක් වූ ඉහල සංඛ්‍යාවක පවතී. මේ අනුව නැවත පදිංචි වූ වැඩිම පිරිස අවුරුදු 50 ට වැඩි පුද්ගලයින්ය. එමෙන්ම අඩුම වයස් කාණ්ඩය 41-50 ත් අතර වූ වයස් මට්ටමයි. මුල් පදිංචියේ සිටි පවුල්වල වයස අවුරුදු 50 ට වැඩි පිරිස් නව පදිංචිය ප්‍රතික්ෂේප නොකර ඇති බව පෙනේ. මෙම පිරිසෙන් බොහෝ දෙනෙකු උපන්දා සිට මෙම ගම්වල මුල්පදිංචිකරුවන්ය. මුල්පදිංචියට අනුව යාන් ඔයට යට වූ ප්‍රදේශවල මහගෙදර තිබූ අතර ඔවුන්ගේ දරුවන් විවාහ වීමෙන් පසු මහගෙදරින් ඉවත් වී විවිධ ප්‍රදේශවලට යාමෙන් පසු එම නිවෙස්වල තනිවූ දෙමාපියන් අවතැන්වූ කොටසක් ලෙස යාන් ඔය ව්‍යාපෘතියට හසුවිය. ඔවුන්ට වෙනත් ස්ථානයකට ගොස් පදිංචි වීමට තරම් කායික-මානසික ශක්තියක් නොමැති නිසාවෙන් සහ අවුරුදු 50 ක් 60 ක් වැනි කාලයක් පුරාවම ඔවුන් පවත්වාගෙන පැමිණි සහ ඔවුන්ගේ ජිවිතවල මුල් බැසගත් ආගමික, සංස්කෘතික සහ ග්‍රාමීය ජිවන ලක්ෂණ වැනි කාරණයන් නිසාවෙන් ඔවුන්ට වෙනත් සමාජයකට ගොස් සමාජානුයෝජනය වීම අපහසුකාර්යක් නිසාවෙන් නැවත පදිංචිය ප්‍රතික්ෂේප නොකර සිටින්නට සිදුවිය (Wanninayake, 2019, Ihalagama, 2015).

මෙහි වැඩි පිරිසක් ගොවිතැන් කටයුතුවල නිරත වන අතර රැකියාවක් සිදුකළ නොහැකි ගෘහ මූලික පවුල් 6% ක් වේ. නමුත් කුලීවැඩෙහි නිරතවන්නන්, රජයේ රැකියාවල

නිරතවන්නන් සහ වෙළෙඳාම් කටයුතු කරන පුද්ගලයන් සියලුදෙනාම ගොවිතැන් කටයුතුවල නිරත වේ. මෙම පවුල් 51 න් 89% ක් ම හේන් ගොවිතැන් කටයුතුවල නිරත වී තිබේ. එහිදී බඩඉරිඟු, කුරක්කන්, වට්ටක්කා, අමුමිරිස් වැනි වගාවන් සිදුකර තිබූ අතර ඒ සඳහා වූ ඉඩම් ද ඔවුන් සතුවිය. එසේම පවුල් 11% ක් කිරි ගව පාලනය නිරතව සිටිති. අනුරාධපුරය යනු ශ්‍රී ලංකාවේ වැඩිම කෘෂිකාර්මික පරිසරයක් සහිත දිස්ත්‍රික්කයක් වන අතර බොහෝ පවුල්වල ප්‍රධාන ජීවනෝපාය වන්නේ ද වී ගොවිතැනයි. ඔවුන්ට ඇතැම් අවස්ථාවල වීවගා කිරීම සඳහා එක් අයෙකුට අක්කර 5 ක් හෝ 10 අතර ප්‍රමාණයක් ඇති අතර ඉන් ලැබෙන වී අස්වැන්න දළ වශයෙන් වී මිටි 200-300 ත් අතර ප්‍රමාණයක් විය. අවුරුද්දකට එක් කන්නක් වගා කිරිමට ඔවුන්ට මුල්පදිංචි ඉඩම් තුළ හැකියාවක් ලැබුණු අතර කන්න දෙකක් වගා කිරිමට නොහැකිවීම ඔවුන්ට ගැටලුවක් නොවුයේ ඉන් ලැබෙන අස්වැන්න ඊලග කන්නය තෙක් ප්‍රමාණවත් වූ නිසාවෙනි. එනිසා ඔවුන්ට අවුරුද්දක් පමණ කාලයක් ආහාර හිඟයකින් තොරව ජිවත් වීමට අවශ්‍ය පරිසරයක් මුල්පදිංචි කාලය තුළ හිමි වී තිබේ.

> *"මෙහෙ ඉන්න අපිට කිසිම පිළිසරණක් නෑ දැං, අපිට අක්කර ගණන් තිබ්බා අපේ අප්පච්චිලාගෙන් හම්බ වුණු කුඹුරු, කන්ට බොන්ට කවදාවත් අපිට අඩු උනේ නෑ, දැං අපිට වපුර ගන්ට කියලා කුඹුරු කෑල්ලක්වත් මේකෙන් දුන්නේ නෑ, දෙනව දෙනවා කියනවා අපි දැං කී තැනකට ගියාද?, මං දිස්ත්‍රික් ලේකම් හම්බ වෙන්ට දවස් කීයක් ගියාද? කිසි කෙනෙක් කිසි දෙයක් කියන්නේ නෑ, දැං යන්ට තියෙන්නේ අපිට මහ තැනට තමා" (සම්මුඛ සාකච්ඡා අංක 07)*

යාන් ඔය ව්‍යාපෘතිය මගින් පවුලක් සඳහා එහි සිටින සාමාජික සංඛ්‍යාවේ ප්‍රමාණය මත යැපීම් දීමනාවක් ලබා දෙනු ලබයි. එහිදී එක් සාමාජිකයෙකුට රුපියල් 2000 බැගින් උපරිම රුපියල් 8000 කට යටත්ව මසකට යැපීම් දීමනාවක් ගෙවනු ලබයි. වෙනත් ආදායම් මාර්ග වෙනස්වීමට ලක් වීම නිසා ඔවුන්ට අමතර ආදායමක් ලැබෙන්නේ නැත. විශේෂයෙන් කෙටිකාලීන හෝග සහ ස්ථිර හෝග මගින් හෝ ලබාගත් ආදායම් මාර්ග එකකුදු හෝ නොමැති තරම්ය. ප්‍රදේශයේ තිබුණු ප්‍රධාන අර්ථ ක්‍රමය ලෙස සැලකෙන කෘෂි අර්ථ ක්‍රමය දුරස්වීමත් සමග ක්‍රමිකව අවතැන්වුවන්ද ඉන් දුරස් වී විවිධ ගැටලු තත්ත්ව උදාවී ඇත (Samarakoon, 2018, Kumarasinghe, 1998).

ව්‍යාපෘතිය මගින් පෙන්වා දෙන ඉඩම් කුමන තැනක තිබුණද අවතැන්වුවන් එහි පදිංචි විය යුතු වේ. එහිදී ප්‍රජාවේ අවශ්‍යතාව මත නොව ව්‍යාපෘතියේ අවශ්‍යතාව මත නැවත පදිංචිකිරීම සිදුවන ආකාරය පැහැදිලි කරුණකි. බොහෝ දුරට මෙහිදී හඳුනාගත හැකි වුවේ නිසි පරිදි වගකීම් බෙදී නොයාමත් නැවත පදිංචිවුවන් පිළිබඳ සොයාබැලීම සඳහා නිසි බලධාරීන්ගේ අවධානය යොමුවීමක් සිදුනොවන බවයි. අවතැන්වුවන් වසර 3-4 ක් ගතවුවත් ඔවුන්ගේ ජීවිත ප්‍රතිසංස්කරණයක් නොවන්නේ නිසි පරිදි වගකීම් බෙදී නොයාමත් අවතැන්වුවන් කෙරේ ඇති අවධානය අඩු මට්ටමක පැවතීමත් යන කරුණු නිසාවෙන් බව පර්යේෂණයේදි තවදුරටත් එළිදරව් විය. මෙහිදි යාන් ඔය ව්‍යාපෘතියේ නැවත පදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ මුලින්ම ප්‍රතිස්ථාපන ක්‍රියාවලියට යොමු කරන ලද්දේ ඍජු ලෙසම ව්‍යාපෘතියෙන් බලපෑම් ඇති වූ ප්‍රජාව අරමුණු කරගෙනය. එහිදී ඉදිකිරීම් කටයුතු සහ ජලාශයට යටවීම යන කරුණු දෙක කෙරේ වැඩි අවධානයක් ලබා දී තිබේ.
යම් ප්‍රතිස්ථාපන ක්‍රියාවලියකින් පසු ඒ පිළිබඳ පසු විපරමක් සිදු කිරීම ඉතා වැදගත් වේ. එය සාර්ථක ප්‍රතිස්ථාපන ක්‍රියාවලියක වැදගත් ලක්ෂණයකි. මෙලෙස වන්දි මුදල් ලබා දුන්

පිරිස මෙහිදි බලධාරීන්ගේ නිසි අවධානයට ලක් නොවීම මෙම ව්‍යාපෘතියේ දුර්වලතාවයකි. අවතැන්වූවන්ගේ ජීවන තත්ත්වය පවත්වාගෙන යාම සඳහා වන්දි මුදල් ගෙවීමට අමතරව මසකට වරක් දීමනාවක් ලබාදීමක් සිදුවිය. එසේම මෙම වන්දි මුදල්වලට අමතර යැපීම් දීමනා ගෙවීමක් සිදු කොට තිබේ. ඔවුන් තමන්ගේ නිවාස ගොඩනගාගන්නා තෙක් සහ ආර්ථිකය යම් තරමකට සකසා ගන්නා තෙක් මෙම යැපීම් ගෙවීම් කටයුතු සිදුකෙරෙන බව මෙහිදි අනාවරණය විය. නමුත් පසුකාලීනව මෙහිදි සිදුවන්නේ ඔවුන්ගේ අවතැන්වීම හුදෙක් ඔවුන්ට ලැබුණු වන්දි මුදලින් ආවරණය කොට දැමීමක් ලෙස හෝ වන්දි මුදලින් තක්සේරු කිරිමක් ලෙස සැලකීමයි.

අවතැන්වූ ප්‍රජාවගේ නැවත පදිංචි කිරිමේදී ඒ පිළිබඳ ඇති අකැමැත්ත සහ නැවත පදිංචිය පිළිබඳ ඇති ආකල්පය වන්නේ මොවුන් නැවත පදිංචිය සඳහා සුදුසු මානසිකත්වයකින් යුක්ත නොවී සිටි පිරිසක් බවයි. මේ අනුව මෙම නැවත පදිංචි කිරිමේදී සිදුවී ඇත්තේ ඔවුන්ට ලැබිය යුතු වන්දි මුදල් සහ ඉඩම් ලබා දී පසු විපරමක් සිදු නොකිරීමයි. මෙම තත්ත්වය ශ්‍රී ලංකාවේ ප්‍රතිස්ථාපන ක්‍රියාවලීන් තුළ පැන නැගී ඇති ප්‍රබල ගැටලුවක් බව මෙහිදි හඳුනාගත හැකිය. මෙම තත්ත්වය හේතුවෙන් අවතැන්වූවන් නැවත පදිංචිය තෝරා ගැනීමේදි බොහෝ පිරිසක් විකල්ප මාර්ග තෝරාගැනීමට පෙළඹී ඇත්තේ ඇයිද යන්න තවදුරටත් පැහැදිලි වේ. එහිදි පිරිසක් නැවත පදිංචි වු ස්ථාන අතහැර යාමටත් කටයුතු කර තිබේ.

> *"අපිට දැනුන් දුන්නා අපිව අයින් කරනවා කියල. එක පාරම හිතාගන්න බැරිඋනා මොකද කරන්නේ කියලා. එතකොට මේ ඩැම් එකෙ ඩෝසර් එහෙම දාලා ටික ටික වැඩ පටන් අරන් තිබ්බේ. අපේ ගම සම්පූර්ණයෙන්ම යට වෙනවා කීවා. අපි හැමෝම කලබල වෙලා හිටියේ ඇත්තටම. මොකද හැමදේම ඉතින් නැති වෙනවනේ. අවසානෙට උනේ අපිව මේ බද කැලේකට ගෙනත් දාපු එක. කරන්ට දෙයක් නැති හිංදා ආවා ඉතින්" (සම්මුඛ සාකච්ඡා අංක 06)*

යාන් ඔය ව්‍යාපෘතියෙන් අවතැන් වු පිරිස සඳහා දියත් කරන ලද ප්‍රතිස්ථාපන ක්‍රමවේදය ඒ ඒ නිවාසවලට සිදු වු හානියේ ප්‍රමාණය අනුව තක්සේරු කරමින් ඒ සඳහා වු විකල්පයට අනුව සහ එම ප්‍රජාවේ කැමැත්ත අනුව යමින් ඔවුන් නැවත පදිංචිකිරිම සඳහා යොමු කිරීම සාධනීය කරුණකි. එහිදි පළමු කරුණ ලෙස හඳුනාගත හැකිවන්නේ වන්දි මුදල් ලබාගෙන අවතැන්වූවන්ට තම කැමැත්ත පරිදි එහි පදිංචිවීමට අවස්ථාව ලබාදි තිබීමය. දෙවැනි කරුණ වන්නේ තමන්ට ලැබුණු වන්දි රැගෙන තමන්ගේ අවශ්‍යතා පරිදි වෙනත් ස්ථානයක හෝ වෙනත් ප්‍රදේශයකට පදිංචියට යෑමේ හැකියාවක් තිබීමය. මෙය ඕනෑම ව්‍යාපෘතියක නැවත පදිංචි කිරිමකදි සිදුවිය යුතු වැදගත් කරුණකි. ඒ අනුව නිලධාරීන්ගේ අවශ්‍යතාව මත නොව ප්‍රජාවේ අවශ්‍යතාව පරිදි නැවත පදිංචිවීම

> *"මෙහෙමයි. අපි ඉඩම් ලබා දුන්නේ සමස්තයක් විදිහට එකම විදිහට. අපි හැමෝටම ඉඩම් දුන්නේ එක සමානව. අපි ගෙවල් ඉදිකරගන්න ගොඩින් අක්කර 01 යි දුන්නේ. ඒක නැවත පදිංචියට අහු උන හැමෝටම අක්කරයක් විතරයි. වෙන ඉඩම් නෑ. මෙහෙ හිටපු හැමෝම කුඹුරු කරපු මිනිස්සු. ඒක නිසා අපිට වාරි ඉඩම් නැත්තම් කුඹුරු ඉඩම් දෙන්න වුනා. ඒකෙදි අපි කුඹුරු අක්කර එක හමාරයි දුන්නේ. ඒකත් අපි වෙනසක් නොකර හැමෝටම එකම විදිහට ඉඩම් බෙදුවේ. එතනින් එහාට කිසිම ඉඩමක් අපි දෙන්නෑ." (සම්මුඛ සාකච්ඡා අංක 04)*

සිදුකර තිබේ. එනම් යම් ආකාරයකින් හෝ තීරණ ගැනීමේදි ප්‍රජා සහභාගීත්වයක් ලබා ගැනීම මෙම ව්‍යාපෘතියේ දී සිදු වී තිබේ.

ඉඩම් ලබාදීමේදී සමාන අවස්ථා සෑම පවුලක් සඳහාම ලැබී ඇති බව මෙහිදී අනාවරණය විය. මෙම කරුණ විශ්ලේෂණය කිරිමේදි පැහැදිලි වන්නේ මෙම ඉඩම් ලබාදීමේ ක්‍රමවේදය තුළ සම පහසුකම් සැමදෙනාටම හිමි වූ බවයි. ඒ අනුව සියලුදෙනාටම සමාන අවස්ථා හිමිකර දීමට කටයුතු කොට ඇති බව පැහැදිලි කරුණකි. මෙම තත්ත්වය සැබවින්ම නැවත පදිංචිකිරීමකදි එම ප්‍රජාව අතර ඇතිවන ගැටුම් වැලැක්වීම සඳහාද හේතුවන බව පෙන්වා දිය හැකිය. ඒ තුළින් ප්‍රජාවගේ දිගුකාලින සහයෝගිතාව වර්ධනය කරගැනීම අපේක්ෂා කර ඇති බවද නිලධාරීන් සමඟ ගැටුම් ඇති වන තත්ත්ව අවම කර ගත හැකි බවද මෙහිදි පැහැදිලි විය. මෙම ඉඩම් ලබාදිමේදි ඒක පුද්ගල අයිතිය එනම් ස්වාමියා සිටීනම් ස්වාමියාට අයිතිය ලැබී ඇති අතර එසේ නොමැති පවුල්වල ඉඩමේ අයිතිය කාන්තාවට ලැබී තිබේ. මෙහිදි වැදගත්ම සාධකය වුයේ ඉඩම් ලබාදීමේදි ස්ත්‍රී පුරුෂභාවය ඉඩමේ අයිතියට බලපෑමක් සිදු නොවීමයි.

ඉඩම් ලබාදීමේදී විශේෂයෙන් මෙහිදි අවධානයට යොමු කළයුතු කරුණක් තිබේ. එනම් ව්‍යාපෘතිය මගින් අවතැන්වුවන්ට ලබාදෙන ඉඩම් සහිත ප්‍රදේශය මුලින් පෙන්වන අතර ඉඩම් තෝරාගැනීම සිදු කරනුවේ ප්‍රජාව විසින්ම පමණි. එහිදි තමන්ට ජීවත්වීම සඳහා සුදුසු  ඉඩම තෝරාගත හැකි අතර ඒ සදහා ඉහළ නිලධාරින්ගේ බලපෑමක් සිදු නොවේ. මෙය ව්‍යාපෘතියක සාර්ථකභාවය පෙන්වන කරුණකි. ඌරුව ගම්මානයේ ඉඩම්වල ස්වභාවය විමසීමේදි අනාවරණය වුයේ මුල්පදිංචි ඉඩම් තරම් නොවුනත් ඒ හා සමාන ලෙස ඉඩම්වල සාරවත්භාවය සහිත ඉඩම් ලැබී ඇති බවයි. මෙහිදි ගොවිතැන් සහ වගාවන් ජීවනෝපාය කරගත් අවතැන්වු ප්‍රජාවට එදිනෙදා වගා කරගත හැකි පරිදි භූමියේ පිහිටීම හේතු වු බවයි. නැවත පදිංචිකරනු ලැබු වාහල්කඩ ඩී6 ගම්මානයේ ඉඩම් පිළිබද විමසීමේදි හඳුනාගත හැකි වුයේ මෙම නැවත පදිංචි කළ ප්‍රදේශය කඳු සහිත ප්‍රදේශයක බෑවුම් සහිත බිමක් සමතලා කරමින් සාදන ලද ඉඩම් බවයි. ඌරුව ගම්මානයට යාමට අකමැත්ත ප්‍රකාශ කළ බොහෝ දෙනා තෝරාගනු ලැබුවේ මෙම ඉඩම් කට්ටි කීහිපයයි. බොහෝ අවතැන්වුවන් පවසන්නේ මෙම ගම්මානයේ තමන්ට ලැබුණු ඉඩම් බොහෝමයක වගාකටයුතු කරගැනීමට තරමක් අපහසු බවයි.

> *"ඇත්තටම මට හිතෙන විදිහට නැවත පදිංචි කිරීමක් සිදුකරන කොට ඒ පැත්තේ මිනිස්සු ඉක්මණටම පදිංචි කරන එක තමා හොඳ. මේ මිනිස්සු ගොඩක් අපහසුතා එක්ක තමා ආවේ. මොකද මේ ගම්වල මිනිස්සු සල්ලි මුදල් හොදට තියන මිනිස්සු නෙවේනේ. එතකොට එයාලා දාන කොහේ හරි ගිහින් ආපහු මුල ඉදන් හැමදේම හදා ගන්න ඕන. දැං මේ ගමේ ඉන්න මගේ දායකයෝ ගොඩක් දෙනා මෙහේ අය නෙවේ. එයාලා කපුගොල්ලෑවේ ඉදල ආව අය. දැං අවුරුදු  3 ක් වෙනවා. ඒත් තාම ඒ මිනිස්සු මුල අල්ලගන්න බැරිව දගලනවා. ඔය* project *එක හරි විදිහට හැමදේම කළා නම් මේ අවුරුදු තුනට මේ මිනිස්සු මීට වඩා හොදට ඉන්නවා." (සම්මුඛ සාකච්ඡා අංක 09)*

මෙහිදි පැහැදිලි වන කරුණක් වන්නේ ව්‍යාපෘතියෙන් අවතැන්වුවන්හට ලබා දුන් ඉඩමේ ස්වභාවය සහ පිහිටීම පිළිබඳ එක් කොටසකට ධනාත්මක ආකල්පයක් පැවතුනද අනෙක් කොටසකට සෘණාත්මක බලපෑමක් සිදුකර ඇති බවයි. විශේෂයෙන්ම අවතැන් වු ප්‍රජාවගේ ආර්ථික මට්මට සහ ජීවිත නගාසිටුවීමට ලබාදෙන උදව්වක් ලෙස මෙම

ඉඩම්වල සාරවත්භාවය සහ නිසරුභාවය යන කරුණු දෙක බලපානු ලබයි. අනෙක් කරුණ වන්නේ මෙහි ඇති ප්‍රධාන ගැටලුව ලෙස ඉඩම් අවට සැරිසරන වනඅලින්ගේ තර්ජනයි. එනිසා ඔවුන්ට මෙහි ගැටලු කිසිවක් නවපදිංචිය තුළින් නිමා වී නොමැති බව ඔවුන්ගේ අදහසයි.

නැවත පදිංචිකිරිමක් සඳහා කාලයක් ගත වීම තුළ ඔවුන්ගේ ජීවිත තිබුණ තත්ත්වයට වඩා කඩාවැටීමට ලක් ව ඇති අතර එය තවත් සමාජ ප්‍රශ්න ගොඩනැගිමට හේතුවක්වනු ඇත. විශේෂයෙන් මෙම තත්ත්වයේ නිරන්තරයෙන් පසු වීම තුළ මානසික රෝගි තත්ත්ව සහ ජීවිතය පිළිබඳ අඩු තක්සේරුවක් මෙම ප්‍රජාවට ඇති වනු ඇත. විශේෂයෙන් කඩිනමින් නැවත පදිංචි කිරිමේ කටයුතු ක්‍රියාත්මක නොවීම තුළ ප්‍රජාවට තමා ජිවත්වන වපසරිය තුළ ඉදිරි පියවර ගොඩනගා ගැනිමට ඇති බිය සහ ජීවිත අස්ථාවරභාවය ඇතිවිය හැකිය. විශේෂයෙන් ස්ථාවර අරමුණු ගොඩනගා ගැනීමට නොහැකි ප්‍රජාවක් බිහිවේ.

කෘෂි අර්ථ ක්‍රමයෙන් ජීවිත ගොඩනගාගන්නා ප්‍රජාවක් තමන්ගේ නිවසේ තිබෙන වී අස්වැන්න දැක වුවද එය ඔවුන්ගේ පාරිභෝජන අවශ්‍යතා දෛනිකව සම්පුර්ණ කරන ලද තත්ත්වයකි. එවැනි පරිසරයක විශේෂයෙන් අවතැන්වු ප්‍රජාවකට තම ආර්ථිකය ගොඩනංවා ගැනීමට දීමනා රැකුලක් වුවත් ඔවුන් පවසන්නේ කුඹුරක් කරගෙන ජිවත්වීම තරම් එය වැදගත් නොවන බවයි. මෙහිදි අවධානයට යොමු කළ යුත්තේ විශේෂයෙන් ගොවිතැන ප්‍රමුඛ කරගත් ප්‍රදේශ අරමුණු කරගෙන ව්‍යාපෘති සිදු කිරිමේදී ඔවුන්ගේ ආර්ථිකය නගාසිටුවීම සඳහා විශේෂයෙන්ම කුඹුරු ඉඩම් කඩිනමින් ලබා දීම සිදුකළ යුතුබවයි. ගොවිතැන් නොමැති ප්‍රදේශවල ව්‍යාපෘතියක් සිදු කරන්නේ නම් එහිදි අවතැන් වන ප්‍රජාවගේ ප්‍රධාන ආර්ථික ක්‍රමයට අනුව ඒ ඒ සුදුසු ක්‍රියාමාර්ග කඩිනමින් ගත යුතුවේ. එය ඔවුන්ට ආර්ථිකම වශයෙන් පමණක් නොව මානසික වශයෙන්ම පරායත්ත මානසිකත්වය බිඳදා ආත්ම විශ්වාසය ගොඩනැගීමට හේතුවක් වේ. එහිදි අවතැන් වු ජනතාව කවුද යන්න නිසි පරිදි හඳුනාගෙන ඔවුන්ගේ නිසි අවශ්‍යතා හඳුනාගනිමින් එම කාර්යන් සිදුකිරිමට සියලු අංශ වගකීමෙන් කටයුතු කළ යුතු බව පැහැදිලි කරුණකි (Vijekumara, 2015). එසේ නොවුණහොත් එම ජනතාව නැවත ප්‍රකෘති තත්ත්වයට පත් කිරිමට වැඩි කාලයක් ගත වනවා සේම අනවශ්‍ය පුද්ගලයන් ඉන් වාසි සලසා ගැනීමටද කටයුතු කරනු ඇත. අවතැන්වූවන්ගේ පුහුණු ශ්‍රමය සහිත කම්කරුවන්ගේ හිගයක් පවතී (Rathnasiri, 2019). හුදෙක් ඉඩම් ලබාදීම පමණක් ප්‍රමාණවත් නොවන අතර එහිදි එම පරිසරයේ ජිවත් වීමට සුදුසු පසුබිමක් එම ප්‍රජාවට තිබෙනවාද යන්න සලකා බැලිය යුතුය. මේ ආකාරයට ව්‍යාපෘතියක් සිදුකිරිමේදි අවතැන්වන ප්‍රජාව නැවත පදිංචි කිරිමේදි රජයක් හෝ යම් ආයතනයක් විසින් යොමු කර නොමැති, නමුත් අවධානයට ලක් කළ යුතු අංශ කීපයක් වෙත එම අවතැන්වු ප්‍රජාව විසින්ම කරුණු හඳුනාගැනීමට හැකිවිය.

අවතැන් වු කාලසීමාව තුළ ඔවුන් නිවාස ඉදිකිරිමේදි විවිධ දුෂ්කරතාවන්ට මුහුණ පා තිබේ. මෙහිදි ඉඩම් ලබාදීමේදි බොහෝ පිරිසක් කැලෑ සුද්ද පවිත්‍ර කරගැනීම තමන් විසින් ම සිදු කරගැනීමට කටයුතු කර තිබුණු අතර රජයෙන් ඒ සඳහා අඩු දායකත්වයක් ලැබුණි. තාවකාලික නිවාස සාදාගැනීම තමන් විසින්ම සිදුකිරිම සහ ඔවුන්ගේ ජිවිතවල අනාරක්ෂිතභාවයට වගකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු නොවී ඇත. තවද ඉඩම් තහවුරු කිරිමෙන් පසු සහ වන්දි ගෙවිමෙන් පසු නිසි බලධාරීන් මේ පිළිබඳ දැඩි අවධානයක් ලබා දී නැත. මේනිසා ඉඩම් සංවර්ධනය සහ ගොවීන්ට වගා කිරිම පිළිබඳව ද ගැටලු ඇති වී තිබේ. ඉඩමක් ලැබු පමණින් ඔවුන්ගේ ජීවිතය සාර්ථක වන්නේ නැත. වන්දි මුදලක් ලැබු පමණින් ඔවුන් ආර්ථිකයෙන් ශක්තිමත් පුද්ගලයන් වන්නේද නැත.

මෙහිදි තවත් ගැටලුවක් වන්නේ ලබා දුන් ඉඩම එම ප්‍රජාවට ප්‍රමාණවත් නොවීමයි. එහිදි තම නිවස ඉදි කරවා ගැනිම සඳහා අක්කරයක ඉඩමක් ලබා දී ඇති අතර එය මුල් පදිංචිය සඳහා ප්‍රමාණවත් බව හඳුනාගත හැකි වුවද එය තවදුරටත් ගැඹුරින් විශ්ලේෂණය කිරිමේදි ඔවුන්ගේ දෙවන පරම්පරාවේ දරුවන්ගේ දරුවන් එනම් තෙවන පරම්පරාවට මෙම ලබා දුන් ඉඩම ප්‍රමාණවත්ද යන්න මෙහිදි ඇතිවන ගැටලුකාරි තත්ත්වයක් බව ඔවුන්ගේ අදහසයි. එය තවදුරටත් පැහැදිලි කිරීමේදි ඔවුන්ට ඉඩම් නොමැති වීමත් ගම තුළ තමන්ට අවශ්‍ය රැකියා නොමැති වීමත් නිසා ගමෙන් නගරයට ඒමට සිදුවන බව මොවුන් තවදුරටත් අදහස් දැක්වීය.

ඒ අනුව අවතැන්වීමට ලක් වු ප්‍රජාව තාවකාලික නිවෙස්වල ජීවත් වන කාල සීමාවල දී වන්දි වශයෙන් ලබා දුන් මුදල්වලදී යම් අසාධාරණයක් සිදුවී ඇති බව අධ්‍යයන දත්ත අනාවරණය කරයි. මෙහිදි මොවුන් පවසන ආකාරයට අක්කර 5 ක් හෝ 6ක් පමණ තිබු ඉඩම් වලින් බොහෝමයක් වන්දි ලැබීමේදි රජයේ ඉඩම් පදනම මත අඩු වීම හේතුවෙන් ලැබුණු වන්දි ප්‍රමාණය අඩු වී ඇති බවයි. විශේෂයෙන්ම මේ තත්ත්වය මත අවතැන්වුවන් සහ නිලධාරීන් අතර යම් යම් මතභේදාත්මක තත්ත්ව ඇතිව තිබේ. මෙයට අමතරව වන්දි ලබා දීමේදී මිනිසුන් තුළ විවිධ මතභේදාත්මක චර්යා මුල් අවස්ථාවල ඇති වු අතර යැපීම් මානසිකත්වය දැඩි ලෙසම බලපෑම් කරඇති බව තවදුරටත් තහවුරු කරගත හැකිවිය.

> *"මේ කෙහෙම්මල් වන්දියක් හින්දා මිනිස්සු ඇනකොටාගත්තේ නැති එක විතරයි. මේ ගෙදර එකා අල්ලපු ගෙදර මිනිහත් එක්ක තරහයි. ඔයි ඔක්කොම වන්දි හින්දා. කට්ටියකට සල්ලිටිකක් වැඩියෙන් හම්බ උනානේ. උන් ටික හොදට ගෙවල් හදාගෙන එද්දි ලොකුකම් දානවා අනෙක් උන්ට. ඒකට දැං ගෙවල් වල කි දෙනෙක් තරහින්ද. එනකොට දිවකට ගාගෙන හිටිය උන් දැං පස්ස හැරිලවත් බලන්නේ නෑ." (සම්මුඛ සාකච්ඡා අංක 08)*

මෙම ගම්මාන කැබිතිගොල්ලෑව නගරයට කිලෝ මීටර්  40 කටත් වඩා ඈතින් පිහිටා තිබේ.  අනෙක් කොටස පදවියට හෝ පුල්මුඩේ දක්වා පැමිණිය යුතුවේ. එනිසා නැවත පදිංචි කළ ප්‍රදේශ නගරයෙන් මායිම් වු හුදෙකලා ප්‍රදේශ වේ.  එම නිසා ඔවුන්ට ශක්තිමත් ආර්ථිකයක් සාදාගැනීම තරමක් අපහසු බව පැහැදිලි කරුණකි. ඊට හේතු වන්නේ ඌරුව ගම්මානයට වඩා වාහල්කඩ ඩී 6 ගම්මානය මඳ බෑවුම් සහිත ප්‍රදේශයක් වූ නිසාවෙන් යම් දිනක පස් කඳු සේදීයාමට හෝ නායයාමේ අවධානයකට පත්වීමේ ප්‍රවනතාවක් එම

> *"මේක හිස් ඉඩමක් විතරයි තවම. දැං තමයි ඔය පොල් ගස් දෙකක් විතර අටවල තියෙන්නේ.  ඉස්සර හිටපු ගෙදර වත්තේ නම් කන්ට කියලා ගහක් කොලයක් හරි තිබ්බා. දැං ඒකත් නෑනේ ඉතින්. දැං කන එකයි බොන එකයි ඔක්කොම ටික සල්ලිවලට තමා." (සම්මුඛ සාකච්ඡා අංක 08)*

ප්‍රදේශයේ දැකගත හැකි නිසාවෙනි. කෙසේ වුවත් මුල්පදිංචිය හා පසුපදිංචිය පිළිබඳ ලබා දුන් දත්ත හා සැසදීමේදි පසු පදිංචි තත්ත්ව කෙරේ ජනතාව නැවත පදිංචි කළ බිම් කොටස් හිස් ප්‍රදේශයක් ලෙස  පවතින අතර එතුළින් පාරිසරික ගැටලු රැසකට මුහුණ දීමේ අවධානම ඉතා ඉහළ මට්ටමක පවතී. ඒ අනුව ඉඩම් සාරවත් නොවීම, ජල පෝෂක සීදියාම, අධික උෂ්ණත්වය, පසේ ඵලදායීතාව හීනවීම, භූමි හායනය ආදි පාරිසරික ගැටලු

තවදුරටත් අවතැන් වු ප්‍රජාව කෙරේ බලපානු ඇත. ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය හරහා අවතැන් වු ප්‍රජාවට ස්වභාවික පරිසරය අහිමි වී යාම, වගා කිරිමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම සහ පාරිසරික සංකුලතා ඇතිවීම ආදිය ජනතාවගේ ජිවන තත්ත්වය කෙරේ සෘණාත්මක බලපෑමක් සිදුකරන බව හඳුනාගත හැකිය.

මෙහිදි අවධානයට ලක් කළයුතු වැදගත් කරුණක් වන්නේ නැවත පදිංචිකිරිමේ කාර්යය හරහා මෙම පාසල්වල එකට හිඳ අධ්‍යාපනය ලබා ගත් බොහෝ දරුවන් දෙකට බේදී කොටසක් ඌරුවත් තවත් කොටසක් වාහල්කඩ ඩී 6 ගම්මානයෙත් පදිංචි වීමයි. මෙම ප්‍රදේශ දෙකෙහි අධ්‍යාපනය ලබන දරුවන්ට ප්‍රධාන ගැටලුව වුවේ පාසල් තෝරාගැනිමේ ගැටලුවයි. ඒ අනුව ඌරුව ගම්මානයේ දරුවන් දලුග්ගල මහා විද්‍යාලයටත් වාහල්කඩ ඩී6 ගම්මානයේ දරුවන් වාහල්කඩ හේමමාලි මහා විද්‍යාලය සහ වාහල්කඩ ඩී5 ප්‍රාථමික විද්‍යාලයටත් යොමු විය. මෙහිදි දරුවන්ගේ අධ්‍යාපනික ගැටලුව සඳහා ළගම ඇති පාසල් කිහිපයෙහි උසස් පෙළ අධ්‍යාපනය දක්වා අධ්‍යාපන අවස්ථා පැවතිය ද එහි එකම පාසලකවත් විද්‍යා විෂය ධාරාව, තාක්ෂණික විෂය ධාරාව, ගණිත විෂය ධාරාවෙන් අධ්‍යාපනය හැදෑරිමට තරම් පහසුකම් නොමැති විය. නමුත් ඌරුව ගම්මානයේ නැවත පදිංචිකරුවන්ගේ අදහස වනුයේ නැවත පදිංචියෙන් පසු එම ප්‍රදේශයට ලැබුන වැදගත්ම කරුණ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු මුල්පදිංචියට වඩා යහපත් ලෙස සිදු කිරිමට අවස්ථාව ලැබීම බවයි. නමුත් වාහල්කඩ ගම්මානයේ දරුවන්ට එවන් පසුබිමක් තවමත් නිර්මාණය වී නොමැත. පාසල නව ගම්මානයේ සිට බොහෝ දුරකින් පවතී. එමෙන්ම මෙම පාසල්වල පවතින ගුරු හිගය තුළ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි කරගෙනයාමට ඇති අපහසුතා දක්නට ලැබේ. ඇතැම් විෂයන් සඳහා ගුරුවරුන් නොමැත. විශේෂයෙන්ම තොරතුරු තාක්ෂණය, ඉංග්‍රිසි, දෙමළ වැනි විෂයන් සේම සෞන්දර්ය අංශයේද යම් යම් ගුරු හිගය මෙම පාසල් තුළ ඇති බව ගම්වැසියන්ගේ අදහසයි. එසේම නැවත පදිංචි කළ ප්‍රදේශයේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා වු පුස්තකාලයක් නොමැති වීම, ක්‍රිඩා පහසුකම් ජල පහසුකම් සහ වැසිකිලි පහසුකම් ප්‍රමාණවත් නොවීමද දරුවන්ගේ අධ්‍යාපනික කාර්යන් විධිමත් පරිදි සිදුකර ගැනීමට මහත් බාධාවක් වී තිබේ (Abeysinghe, 2020, Wanigasooriya, 2013). එසේම මෙහිදි හඳුනාගත හැකි විශේෂිත කරුණ වන්නේ මෙම ප්‍රදේශයන්හි අඩුවයස් විවාහය බහුල ලෙස පැවතීමයි. අධ්‍යාපන වටපිටාවක් සහිත පරිසරයක් මෙම ප්‍රදේශයේ අල්ප වශයෙන් පවති.

> *"මේ ප්‍රදේශයේ ගොඩක්ම තියෙන්නේ අඩු වයසින් පාසල් යන දරුවෝ පැනල යනවා. නැත්තම් විවාහ වෙන එක. ඒක වසර ගණනාවක් එක දිගටම අඛණ්ඩව පැමිණෙන ක්‍රියාවලියක්. ලොකු ප්‍රමාණයක් දරුවෝ සාමාන්‍ය පෙළ ලියන්නත් කලින් තමන්ගේ ජිවිතේ මේ තත්වයට පත් කරගන්නවා. එකට හේතුව එයාලගේ පවුල් පසුබිම වෙන්නත් පුලුවන්. මේ පැත්තේ දෙමාපියොත් ඉගන ගත්ත පිරිසක් නොවේ. සීයයට අසුපහකට වඩා වැඩි ප්‍රමාණයක් ඉගෙනගෙන නෑ. ඒ වගේම අකුරු ලියන්න කියන්න බැරි වැඩිහිටියන් ලොකු ගාණනක් ඉන්නව" (සම්මුඛ සාකච්ඡා අංක 11)*

බොහෝ දෙනා ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පාසල් අධ්‍යාපන කටයුතු අතරමග නතර කර දමයි. එහි ප්‍රතිඵලයක් ලෙස දෙමාපියන් සිය දරුවන් විවාහ කර දීමට යොමුවන අතර ඇතැම් අවස්ථාවල තරුණ දරුවන් තමන්ට වඩා වැඩි වයසක පසුවන පුරුෂයන් සමඟ තම දෙමාපිය අවසරයකින් තොර විවාහ වීමේ ප්‍රවනතාවක් ද පවතී. එනිසා අඩු වයස් විවාහය වැඩි වශයෙන් පවතින ප්‍රදේශයක් ලෙස මෙම ප්‍රදේශය පෙන්වා දිය හැකිය. එහි

ඇති දරුණුම බේදවාචකය නම් අඩු වයසින් ගැබ් ගැනීමත් අඩු වයසින්ම එම දරුවන් දික්කසාද තත්ත්වයට පත් වීමත්ය.

අවතැන්වූවන්ගේ ජල පරිභෝජනය සැලකීමේදී 29% ක පිරිසක් නළ ජලය භාවිත කරන අතර 22% ක ප්‍රමාණයක් තමන්ට ළිදක් නොමැති බැවින් අසල්වැසි ළිඳකින් ජලය භාවිතයට ගනී. එසේම තමන්ගේම ළිද භාවිත කරමින් ජලය ලබා ගන්නා ප්‍රමාණය 25%ක් වන අතර ජලසම්පාදනයෙන් පමණක්ම ජල පරිභෝජනය කරන පවුල් 24% ක් වේ. ජලසම්පාදන මණ්ඩලය හරහා ෆිල්ටර් කළ වතුර මොවුන්ට ලබා දෙන අතර එයද ගමේ ජනගහනය අනුව ප්‍රමාණවත් නොවන බවයි. නමුත් ඉන් කොටසක් තම අවශ්‍යතා සපුරා ගැනිම සඳහා පෞද්ගලික ඉඩම්වල ළිං කපාගෙන ඇති අතර එහිද ජලය ප්‍රමාණවත් තරම් නොමැති වීම ඌරුව ගම්මානයට මහත් ගැටලුවක් වී තිබේ. ඔවුන් පවසන්නේ ජූලි සහ අගෝස්තු වැනි මාස තුළ මෙම ගම්මානයේ ඇති කිසිදු ළිඳක් තුළ ජලය සොයාගැනීමට නොහැකි බවයි.

එසේම මොවුන් පවසා සිටින්නේ නැවතපදිංචි කළ ගම්මානයේ විධිමත් ලෙස මාර්ග පද්ධතිය සකස් වී නොමැති බවයි. බොරලු පාර ද මේවන විට අබලන් වී වලවල් සහිත බැවින් ගමන් කිරීම දැඩි දුෂ්කර කාර්යයකි. විශේෂයෙන් වර්ෂාකාලයේ නිසි ලෙස ජලය බැසයාම සඳහා විධිමත් ක්‍රමවේද අනුගමන කර නොමැති නිසාවෙන් පාර සෝදාපාලුවට ලක් වී අනාරක්ෂිත තත්ත්වයට පත්ව තිබේ. බොරලුපාර නඩත්තු නොකළහොත් පාර ඉතා ඉක්මණින් විනාශ වී යන බව ඔවුන්ගේ මතයයි. එනිසා මගී ප්‍රවාහන පහසුකම් ශක්තිමත් කළ යුතු බව ගම්වාසීන්ගේ ඉල්ලීම විය. ඔවුන් තවදුරටත් දක්වන්නේ හැකිනම් දවසට දෙපාරක් හෝ ගමන් කරන පොදු ප්‍රවාහන රථයක් ගම මැදින් යාමට කටයුතු කරන්නේනම් එය ඔවුන්ගේ ජීවන ගමනට මහත් රුකුලක් වන බවයි.

යාන් ඔය ව්‍යාපෘතියේ යටිතල පහසුකම් පිළිබඳ සැලකීමේදී ගමට අවශ්‍ය ප්‍රජාශාලාවක් පන්සලක්, පුස්තකාලයක් වැනි පොදු ස්ථාන නොමැති වීම විශේෂිත වේ. විශේෂයෙන් ගමේ රැස්වීමක් පැවැත්වීමට ගමේ පොදු කටයුත්තක් සඳහා මිනිසුන් එක් රැස් කරගැනිම සඳහා ප්‍රජාශාලාවක් නොමැති වීම ගම තුළ ඇති පොදු ගැටලුවකි. දැනට ඌරුව ගම්මානය තුළ පමණක් පන්සලක් ඉදිකර දී ඇති අතර අනෙක් පහසුකම් කිසිවක් මෙම කාලය තුළ ලබා දී නොමැත. එසේම එවැනි අවශ්‍යතා සඳහා ඔවුන් අසල්වාසි ගම්මානයේ ප්‍රජාශාලාව භාවිත කරන අතර එසේ නොමැතිනම් පන්සල මේ සඳහා යොදා ගනිති. සුභසාධක සමිති, අවමංගල්‍යාධාර සමිති, ගොවි සමිති මෙන්ම බෞද්ධ සමිති ආදි ප්‍රජා මුල සංවිධාන වෙනස් වීම තුළ ගම්වැසියන්ට දැඩි ලෙස බලපෑම් විය. මෙහිදී විශේෂයෙන් අනාවරණය වුයේ බොහෝ ලෙස ගමක උත්සවයක් මළගෙදරක් තිබූ අවස්ථාවල දිවා රෑ නොබලා වෙහෙසුණු මිනිසුන් නව පදිංචියත් සමග යම් යම් මතගැටුම්වලට ලක්වීමත් සමග තිබූ සුහදත්වය පලුදු වූ අවස්ථා රැසක් පවතින බවයි. ඔවුන් දක්වන්නේ වන්දි ලබා දීමේදී මෙන්ම නව නිවාස ගොඩනැගීමේදී අනෙකා අභිබවා යෑමේ අදහස සහ ආකල්ප හරහා තිබූ සම්බන්ධතාත් වෙනස්වී ගිය බවයි. එසේම නව ගම්මානයට බැංකුවක්, තැපැල් කාර්යාලයක්, වෘත්තීය පුහුණු මධ්‍යස්ථානක් ආදිය මෙම ප්‍රදේශ තුළ තවමත් ඉදිකර නොමැති බැවින් ඔවුන් ඒ පහසුකම් ලබාගැනීම සඳහා නගරයට යායුතු බව මොවුන්ගේ අදහසයි. එසේම බැංකු සහ මූල්‍ය පහසුකම් සඳහා ද නගරයට යා යුතු අතර වාහල්කඩ ගම්මානයේ ඇත්තේ ලංකා බැංකු ශාඛාවක් පමණි. නමුත් අනෙක් මූල්‍ය ආයතන සඳහා නගරයට ඒමට මෙම පිරිසට සිදුවේ. මෙම නැවත පදිංචි කළ ග්‍රාම දෙකෙහිම රෝහල් පහසුකම් ඇත්තේ අවම වශයෙනි. ඔවුන්ට ඒ සඳහා

නගරයට යාමට සිදුවේ. එසේම අවතැන් වූ ප්‍රජාව බහුතරයක් මැදිවියේ මෙන්ම මහලුවියේ පසුවන්නන් නිසා ඔවුන්ගේ අදහස් පරිදි නිරන්තරයෙන් ලෙඩ රෝගවලට භාජනය වීමේ වැඩි ප්‍රවනතාවක් ඇත. ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය හරහා අවතැන්වූවන්ගේ මානසික තෘප්තිය මුල් පදිංචියට සාපේක්ෂව අඩු මට්ටමක පවතින බව හඳුනාගත හැකිවිය. මුල්පදිංචි වකවානුවට වඩා නව පදිංචියේ ඇති කාර්යබහුලත්වය, ගැටලු සහ බාධක හමුවේ තමන්ගේ ආගමික වතාවත් සිදුකිරිම ඔවුන්ට මගහැරුණු බව ප්‍රතිචාරකයින්ගේ අදහසයි. මෙම තත්ත්වයද ඔවුන් මානසික වශයෙන් සහ අධ්‍යාත්මික වශයෙන් පිරිහීමට හේතුවක් වී ඇති බව පෙනේ.

ප්‍රතිස්ථාපන කටයුතු සිදුකිරිමේදි පවුල් පදිංචිකිරිමේ යම් යම් දුර්වලතා දක්නට ලැබේ. විශේෂයෙන් මෙහිදි ඌරුව ගම්මානයේ තීරු ජනාවාස ක්‍රමයත්, වාහල්කඩ ඩී 6 ගම්මානයේ පොකුරු ජනාවාස ක්‍රමයත් අනුගමනය කර ඇත. ඌරුව ගම්මානයේ නැවතපදිංචි කොට ඇත්තේ ගමට ඇතුලුවන පාර දිග එක් තීරුවක් දෙසට පමණි. එමගින් ජනපදයේ අන්‍යෝන්‍ය සුහදත්වය සඳහා බලපෑම් ඇති වන අතර අන්තර් සම්බන්ධතා පැවැත්වීම තරමක් දුෂ්කර තත්ත්වයක් වන බව නිරික්ෂණය තුළදී පැහැදිලි විය. නමුත් වාහල්කඩ ඩි 6 ගම්මානයේ පොකුරු ජනාවාස ක්‍රමය තුළින් තීරු ජනාවාස ක්‍රමවේදයට වඩා අන්‍යොන්‍ය සුහදත්වය ගමේ ප්‍රජාව අතර දක්නට ලැබෙන බව අනාවරණය විය. සංස්කෘතිකමය සහ සමාජ දුරස්භාවය පුද්ගල මානසිකත්වය අතෘප්තිකර වීමට බලපායි. නැවත පදිංචි කිරිමේදී මෙම තත්ත්වය බෝහෝදුරට දැකිය හැකිය (Rathnayake & Dissanayake, 2018).

මෙම ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය තුළදි මුල්පවුල් සඳහා පමණක් නොව අනුපවුල් සඳහාද නිවාස ඉදිකිරිම සඳහා ඉඩම් ලැබුණි. මෙම තත්ත්වය එම පවුල්වල අනාගත අභිවෘද්ධිය වෙනුවෙන් යහපත් තත්ත්වයක් වුවද ඒ තුළින් ඥාති සම්බන්ධතා දුරස් වීමට හේතුවක් වූ බව පැහැදිලිය. ඔවුන් පවසන්නේ මුල් පදිංචියේදී තමන්ගේ දෙමාපියන් සමග ජිවත් වූ නිසාවෙන් ඔවුන්ගේ දරුවන්ට රැකවරණය පිළිබඳ ගැටලුවක් නොවූ බවයි. නමුත් නවපදිංචියේදි පවුල් දෙකට බෙදීයාම නිසා දෙමාපියන් වෙනම නිවසක තනිවූ බවත් ඔවුන් වෙනත් ස්ථානයක පදිංචි වූ බවත් අනාවරණය විය. මුල් කාලවකවානුව තුළ තම කුඩා දරුවන්ට එය මානසික කම්පන තත්ත්වයක් ලෙස තිබූ බව ප්‍රතිචාරකයන් දැක්වීය. මහගෙදර වටා එක්රොක් වී සිටි පවුල් කැඩීයාම හේතුවෙන් සමාජානුයෝජන කාර්යයට බලපෑමක් ඇති වී තිබේ. එම තත්ත්වය දරාගැනීම අපහසු දරුවන් විවිධ මානසික ගැටලුකාරි ස්වභාවයන්ට පත් වූ බව අනාවරණය විය.

## 6. නිගමන

- මෙම ප්‍රතිස්ථාපන ක්‍රියාවලිය තුළින් ජනතාවට පදිංචිය හරහා ඉඩම් ලබා දුන්නද ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති මෙම ගොවින්ට තවමත් ගොවිතැන් කටයුතු කිරිම සඳහා කුඹුරු ඉඩම් නොලැබිම මත ආර්ථිකය කඩා වැටීමක් සිදුවි ඇති බව සමස්තයක් ලෙස හඳුනාගත හැකිය. එසේම ගොවිතැනට අමතරව ඔවුන් සිදුකළ ඉරිගු, කුරහන්, එලවලු වැනි හේන් භෝග වගා කිරීමද දුර්වල වී ඇත. ඔවුන්ට හේන් ගොවිතැන සඳහා මුල් පදිංචියේදි ඉඩම් තිබූ අතර මෙම ව්‍යාපෘතිය හරහා හේන් සඳහා වූ ඉඩමක් නොලැබුණු අතර ඔවුන්ගේ ද්විතික ආදායම් මාර්ගද අහිමි වී තිබේ. මුල් පදිංචිය තුළ තිබූ ගොවි බිම්වල සාරවත්භාවය නවපදිංචියෙන් ලැබුණු මද බෑවුම් සහිත නිසරු ඉඩම් හේතුවෙන් එම ප්‍රජාවට ස්ථිර භෝග මෙන්ම එදිනෙදා පරිභෝජනය උදෙසා

හෝ වගා කිරීමට සුදුසු ඉඩම් ලැබී නොමැති වීම හේතුවෙන් ඔවුන්ගේ එදිනෙදා පරිභෝජන රටාව උදෙසා වැඩි වියදමක් දැරීමට සිදුව ඇත. මින් ඔවුන්ට තම ආර්ථික පසුබිම පාලනය කරගැනීමට නොහැකිවී ඇත. මෙය පුද්ගල සාධනය අහිමි කර ඇත.

- භූමියෙන් යැපීමට පුරුදුවු බහුතරයක් ප්‍රජාව ගොවිතැන හරහා වැඩි දෙනෙකුට පවුලේ රැකියා ප්‍රමාණයක් හිමි වුවත් නවපදිංචිය නිසා වැඩි පිරිසක් රැකියා විරහිත මට්ටමේ පසුවීම ඔවුන්ගේ පවුල්වල ආර්ථිකය තව තවත් පසුබෑමට ලක්විය. තම සවි ශක්තියෙන් ආර්ථිකය ගොඩනංවාගත් මෙම පිරිස වන්දි මත යැපෙන්නන් බවට පත් වී ඇත. එමෙන්ම ව්‍යාපෘතියේ ආරම්භයේදී ඇස්තමේන්තුගත කරන වන්දි ප්‍රමාණය ගෙවීම් සිදුකිරීමේදී විවිධ විෂමතාවන්ට ලක් වී ඇත. එනිසා ඔවුන්ගේ යැපුම් මානසිකත්වය තව තවත් අඩු ආදායම් තත්වයක් කරා යොමුකිරීම සුබදායිනොවන බව මෙහිදී නිගමනය කළ හැකිය. ව්‍යාපෘතිය පිළිබඳ පසුවිපරම සිදුකිරීම විධිමත් ලෙස සිදුවී නැත.

- එමෙන්ම ඥාති සම්බන්ධතා දුරස් වීම, සමුහ සම්බන්ධතා ජාල බිඳ වැටීම මෙන්ම අසල්වාසි සම්බන්ධතා දුරස්වීම නැවත පදිංචිකිරීම හරහා සිදුවී තිබේ. සාමුහිකත්ව අන්‍යෝන්‍ය විශ්වාසය මත ගොඩනැගුණු සමාජ සම්බන්ධතා මෙන්ම විස්තෘත පවුල් ක්‍රමය වෙනස් වී ඇති අතර ඉඩම් ලබාදීමේ ක්‍රමවේදය හරහා න්‍යෂ්ටික පවුල් ක්‍රමය දක්වා පවුල් බිඳී යාම ප්‍රධාන සමාජානුයෝජන කාරක අහිමිවීම යන අවධානම් තත්ත්ව ගොඩනැගී ඇත. විශේෂයෙන් නැවත පදිංචියේදී ප්‍රධාන පවුල් සහ අනුපවුල් ලෙස වෙන් කිරීම මත මෙම තත්ත්වය ඇතිවිය. සමාජ ඒකාබද්ධතාව සහ අනුකලනයට තිබූ ඉඩකඩ අහිමිවී ඇත.

- එමෙන්ම ප්‍රජාමුල සංවිධානය බිඳවැටීම හේතුවෙන් ජනතාවගේ සංවිධානාත්මක ක්‍රියාත්මකවීම වෙනස්වී ඇති අතර එමගින් ග්‍රාමීය සාමුහිකත්ව ලක්ෂණ අභිබවා හුදෙකලා පවුල් බිහිවී ඇත. එම තත්ත්වය තුළ අනුකලය බිඳවැටීම, සාමුහිකත්වය බිඳ වැටීම හරහා එකිනෙකා කෙරෙහි වු සැකය, ආත්මාර්ථකාමීත්වය සහ ඉච්ඡාභංගත්වය සහිත පසුබිමක් නිර්මාණය වී ඇත.

- ගොඩ සහ මඩ ඉඩම් ලබාදීමේ තිබූ සමානාත්මතාව හේතුකොටගෙන මුල් පදිංචියේදී තනි අයිතිය සහිත ඉඩම් වැඩි ප්‍රමාණයක් තිබූ පිරිස් අසාධාරණයට ලක් වීම සහ ප්‍රධාන පවුල් සහ අනුපවුල් යටතේ ඉඩම් ලබා දීම හේතුවෙන් විස්තෘත පවුල් යටතේ සිටි බොහෝ දෙනාට සාධාරණයක් ඉටුවීමත් මෙහිදී හඳුනාගත හැකිය.

- ප්‍රතිස්ථාපන ක්‍රියාවලියක් තුළදී අවතැන්වූ ප්‍රජාව ස්ථානගත කිරීමේදි ඔවුන් ස්ථානගත කරන්නේ සුදුසුම ස්ථානයේද යන්න බලධාරින්ට නිසි අවබෝධයක් තිබිය යුතුවේ. විශේෂයෙන් අධ්‍යයනයේ සඳහන් කළ සමස්ත ගැටලු ඇති නොවන පරිදි ස්ථානගත කිරීමට ප්‍රමාණවත් පහසුකම් තිබේද සහ එම ස්ථානය සුදුසු පරිසරයක්ද යන්න හඳුනාගත යුතුවේ. එසේ නොමැති වුවහොත් නැවත පදිංචි වු පිරිස් අතර වැඩි පිරිසක් මහලු අවධියේ පිරිස් වීමෙන් අනාගතයේ එම ප්‍රදේශය ආශ්‍රිතව බහුල ලෙස මහලුවියේ ගැටලු ඇතිවේ. එය සමාජ ගැටලුවක් දක්වා වර්ධනය විය හැකි බව නිගමනය කළ හැකිය.

නැවත පදිංචිකිරිමේ ක්‍රියාවලියක් සිදුකිරිමේදී අවතැන්වූවන් සවිබලගැන්වීම අනිවාර්ය වේ. එහිදී පුද්ගලයා තම අපේක්ෂා සාධනය කරගත යුතුය. තම බලය ගොඩනගාගත යුතුය. එසේම එක්ව වැඩකිරීමේ අවස්ථාව ගොඩනගාගත යුතුය. මේවා ක්ෂාත්ක්ෂාත් කරගත හැක්කේ ඒ පිළිබඳ පසුවිපරමක් සිදුකිරීමෙනි (Braden, 2000). ප්‍රතිස්ථාපන ක්‍රියාවලියක් සැලසුම් කිරීමේදි ප්‍රජා සහභාගීත්වය නොමැතිවිම හෝ අවම මට්ටමේ පැවතීම මත නැවත පදිංචි කිරිමේ ක්‍රියාවලිය අසාර්ථක මට්ටමක් කරා ගෙනයාමට වැඩි ප්‍රවනතාවක් ඇති වන බැවින් ප්‍රජාවේ ආකල්ප හඳුනාගැනීම වැදගත් වේ. නමුත් යාන් ඔය ව්‍යාපෘතිය නිසා අවතැන්වූවන් පිළිබඳ සාධනීය පසුවිපරමක් කර නොමැති බව පෙනේ. මෙම තත්ත්වය දිගින් දිගටම පැවතුණහොත් තිරසාර සංවර්ධනයක් කරා රටක් ගමන් කිරීමට අපහසු වනු ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**


කුමාරසිංහ, බී. (1998). *මහකනදරාව ව්‍යාපාරයේ තුන්වන ගොවි පරපුර වෙත උදාවී ඇති සමාජ ආර්ථික ගැටලු පිළිබද අධ්‍යනය.* කැළණිය: කැළණිය විශ්වවිද්‍යාලය.

හිරණ්‍ය ඩී. ඩයස් සහ බී.ඩබ්.ඊ. වික්‍රමනායක. (1983). *ගැමි සංවර්ධන සැළසුම්කරණය.*

Abeysinghe, C. (2020). *The Impact of Decentralization on Local Educational Development: A Study on Provincial Council System in Sri Lanka.* Ideal International Journal of Igbo Scholars Forum, Nigeria, Volume 13.

Braden, P.A. (2000). *Lecture on McClelland's Theory of Needs*; https://changecom.files.wordpress.com/

Ihalagama, S. (2014/2015). *Specialties of Informal Traditional Communication Methods of Sri Lanka*, The Journal of Humanities, University of Kelaniya, Volume 23.

Jayasiri, M. M. J. G. C. N. Diyawadana, D.M.N. Samarakoon, S. M. L. D. Pathmarajah, S & Dayawansa, N. D. K. (2018). *A Gendered Analysis on Adaptation to Resettlement Stress: Case Studies from Deduru Oya Reservoir Project in Sri Lanka*. National Science Foundation. http://dl.nsf.ac.lk/handle/1/24289

Rathnayake, R., & Disanayake, H. (2018). *Psychological Risks of Resettles in Resettlement Planning: A Study in Moragahakanda Resettlement Project (MRP).*

Rathnasiri, C. (2019). Resettlement of Population at High Risk of Natural Disasters in Sri Lanka. https://www.researchgate.net/publication/335060679_Resettlement_of_Population_at_High_Risk_of_Natural_Disasters_in_Sri_Lanka

Samarakoom, M.T. (2018). *Moragahakanda Development Project in Sri Lanka: Localization of Development Projects in Rural and Effects on Communities*. Arts & Humanities Open Access Journal, Volume 2.

Seers, D. (1969). *The Meaning of Development. IDS Communication 44*, Institute of Development Studies.

Vijekumara, P.P. (2015). *A Study on the Resettlement Planning Process Applied in Post-Landslide Disaster Resettlement Projects in Sri Lanka*, Human Settlement Planning and Training Division, National Building Research Organization, Sri Lanka

Vitharana, L.D.S. (2014). *Development; Conceptual and Implementation*. Felicitation volume for Prof. Prema Podi Menike, University of Kelaniya.

Wanigasooriya, A.W.A.P.L. (2013). '*A National Collaborate Plan for the Development of Libraries in Sri Lanka*'. Second International Conference of Social Sciences, pp.49

Wanninayake, S. (2017[a]). '*Making a 'Home' Internal Displacements and Resettlement Processes in Sri Lanka 2002-2006'*, Publisher: University of Gothenburg. ISBN: 978-91-629-0033-5

Wanninayake, S. (2019[b]*). A Brief Conceptual Analysis on Conflict Induced Internal Displacement, Return and Resettlement*. Sri Lanka Journal of Sociology, Vol-01, ISSN 2706-008X